දිවි තොර කරගැනීම් මහජන සෞඛ්‍ය ගැටළුවක් ලෙසින් වාතර්‍ා කරන්නේ නම්, මාධ්‍ය අතිශයින්ම සැලකියයුතු කරුණක් වන්නේ, එය මානසික සෞඛ්‍යය පිළිබඳ ගැටළුවක්ය යන කෝණය ඔස්සේ එය ඉදිරිපත් කිරීමයි. එහිදී නිසි සහකම්පනයකින් යුතු, හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) නොවෙන ආකෘතියක් භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ.

දිවි තොර කර ගැනීම යන මහජන සෞඛ්‍ය ගැටළුව පිළිබඳව පාඨකයින්ව දැනුවත් කිරීමට ලියවෙන ලිපි සම්බන්ධයෙන් මෙය විශේෂයෙන් අදාළ වේ.

එසේම, එවැනි ලිපි සමඟින් හදිසි උපකාරක අංක සඳහන් කිරීමද අවශ්‍ය වේ. මන්ද යත්, දිවි තොර කර ගැනීමේ නැඹුරුතාවයකින් සිටින අයකු උපදේශනය වෙත යොමු කරවා දිවියක් බේරාගැනීමට ඉන් අවකාශ සැලසිය හැකි බැවිනි.

එම පසුතලය යටතේ, සරසවි සිසුන්ගේ දිවි තොර කරගැනීම් සම්බන්ධයෙන් අදාළ විෂයන්හි විශේෂඥයින්ගේ අදහස් ද සමගින් පළ වී ඇති ලිපි කිහිපයක් සළකා බැලිය හැක. ඒවායේ සිරස්තල මෙසේය.

*"ෆේස්බුක් එකේ හායි කියන්න පුළුවන් වුණාට සමාජයට මුහුණ දෙන්න පෞරුෂයක් නැත්තේ ඇයි?" - මව්බිම (ජුනි 25, 2023)

* "පේරාදෙණිය මල් අත්තක් මිසක් කටු අත්තක් කරගන්න එපා" - අරුණ (ජුනි 27,2023)

* "එල්ලෙන්නෙ නැතුව මේ දරුවා ඉවසුවා නම් අද ඉංජිනේරුවෙක්" - සති අග අරුණ (ජුනි 25, 2023)

ඔබ සිතන ලෙසට,

1) දිවි තොර කර ගැනීම යන මහජන සෞඛ්‍ය ගැටළුව සම්බන්ධයෙන් කතිකාවක් ඇති කිරීම ප්‍රශංසනීය වුවද, මෙම ලිපි නිසි සහකම්පනයකින් යුතුව, දිවි තොර කර ගැනීම් යනු මානසික සෞඛ්‍ය පිළිබඳ ගැටලුවක්ය යන කෝණයෙන් ඉදිරිපත් වී ඇතැයි ඔබ සිතන්නේ ද?

2) මෙම ලිපි හා හදිසි උපකාරක අංක සඳහන් විය යුතු නොවේද?